**ශීර්ෂය - 126 අධ්‍යාපන අමාත්‍යාංශය**

---------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

අධ්‍යාපන අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අධ්‍යාපන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජුනි 20 දින ප්‍රධාන ගණන්දිමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අධ්‍යාපන අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 අගෝස්තු 08 දින ප්‍රධාන ගණන්දිමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට අධ්‍යාපන අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) මෙම වාර්තාවේ 1.6.1 (අ) ඡේදයේ නිරීක්ෂණ සම්බන්ධයෙන් ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය නොවන වත්කම්

මූල්‍ය ප්‍රකාශන වලට අදාල මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | 2021 වර්ෂයේ දී මූල්‍ය නොවන වත්කම් මිලදී ගැනීම් වටිනාකම් හා මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය අතර රු.8,047,201,388 ක වෙනසක් පැවතුණි**.** | වත්කම් ශේෂයන් අතර වෙනසට හේතු වී ඇත්තේ භාණ්ඩාගාර ගිණුම් තුලනය කිරීම සඳහා භාණ්ඩාගාරය විසින් සිදු කරනු ලබන ගැලපීමය. | මිලදී ගැනීම් වල අගයන් හා ACA 2(i) අගයන් සමාන විය යුතු වීම. |
| **(ආ)** | මූල්‍ය නොවන වත්කම් වල ඉකුත් වර්ෂයේ අවසාන ශේෂ සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂ ලෙස ගිණුම්ගත කිරීමේදී රු.5,115,162,713 ක වෙනසක් නිරීක්ෂණය විය**.** | මාසික ගිණුම් සාරාංශයට හා ස්ථාවර වත්කම් system එකට ඇතුලත් කරනු ලබන ස්ථාවර වත්කම් මිල වටිනාකම් තුලනය කර මාසිකව අමාත්‍යාංශය වෙත වාර්තා කරන ලෙසට සියළුම කාර්යාල දැනුවත් කිරීමට කටයුතු කරමි. | ආරම්භක හා අවසාන මූල්‍ය නොවන වත්කම් ශේෂ සැසඳී තිබිය යුතු වීම.<br>. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් සඳහා ලැබී තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය පිළිවෙලින් රු.**43,274,600,000** ක් හා රු.**23,951,948,000** ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රතිපාදන පිළිවෙලින් රු.**1,265,682,252** ක් හා රු.**4,297,834,845**ක් ඉතිරි වී තිබුණි. | **2021** වර්ෂයේ පැවතුනු කොවිඩ් **19** වසංගත තත්ත්වය හේතු වි ඇති බව | අරමුණු ඉටු කර ගැනීම සඳහා සැලසුම්ගත පරිදි ප්‍රතිපාදන උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

**2.2** බැරකම් හා බැදීම්වලට එළඹීම
-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛනයේ 2(ඈ) විධිවිධාන වලට පටහැනිව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව රු.9,910,403,566 ක බැරකම්ද රු.2,244,165 ක බැදීම්ද ඇතිකර ගෙන තිබුණි. | නිරවුල් කරන ලද නමුත් සිගාස් වැඩසටහන තුල යාවත්කාලීන නොවූ බැරකම් හා තාක්ෂණික ගැටළු මත සිගාස් වැඩසටහන යාවත්කාලීන නොවීමෙන් මූල්‍ය ප්‍රකාශයේ ඇතුළත් කර ඇත. | බැදීම් හා බැරකම් සම්බන්ධයෙන් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | වැය විෂයයන් 18 කට අදාළව රු.1,925,895,033 ක ඉතිරිය ඉක්මවා බැරකම් ඇති කරගෙන තිබුණි. | සමහර බැදීම් හා බැරකම් මේ වන විට ගෙවා ඇති අතර තාක්ෂණික ගැටළු මත සිගාස් වැඩසටහන යාවත්කාලීන නොවීමෙන් මූල්‍ය ප්‍රකාශයේ ඇති බැදීම් හා බැරකම් ලේඛනයෙන් ඉවත්කිරීමට අදාල අංශ වෙතින් විමසීම් කර ඇති බව. | ඉතිරිය ඉක්මවා බැරකම් ඇති කර ගැනීම නොකළ යුතුය. |
| (ඇ) | උසස් අධ්‍යාපන අංශයට අයත් රු.1,059,850 ක බැදීම්, රු.3,691,502 ක බැරකම් හා මු.රෙ. 94(2) (3) ප්‍රකාරව එළඹෙන ලද රු.76,318,524 ක බැදීම් අමාත්‍යාංශය ගිණුම්වල ඇතුලත් කර නොතිබුණි. | උසස් අධ්‍යාපන අංශය ලබාදී ඇති කෙටුම්පත් වාර්තාවේ සියලුම බැරකම් ඇතුලත් වී නොතිබීම මඟින් දක්වා ඇති බැරකම් අධ්‍යාපන අමාත්‍යාංශයේ ඒකාබද්ධ විසර්ජන ගිණුමට ඇතුලත් වී නොමැති බව. | ශීර්ෂයට අදාල සියලුම බැරකම් හා බැදීම් ගිණුම් වලට ඇතුලත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් බැරකම් උපලේඛන අනුව 2018,2019 සහ 2020 වර්ෂවලට අදාල රු.2,026,521,143 ක බැරකම් නිරවුල් කිරීමට කටයුතු නොකර**,** සමාලෝචිත වර්ෂයේ බැරකම්වලට ඇතුලත් කර තිබුණි. | මූල්‍ය ප්‍රකාශනයේ සටහන **(iii)** යටතේ දක්වා ඇති බැදීම් හා බැරකම් ලේඛන සකස් කර ඇත්තේ සිගාස් වෙබ් අඩවියේ උඩු ගත කර ඇති තොරතුරු අනුව වේ.මෙහිදී අතැම් බැරකම් නිරවුල් වුවද එම තොරතුරු තාක්ෂණික දෝෂ මත සිගාස් වෙබ් අඩවියේ යාවත්කාලීන වී නොමැති බව | බැරකම් නිරවුල් කිරීමට හා නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

**2.3 තැන්පතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මුදල් රෙගුලාසි **571** පටහැනිව වර්ෂ **02** ක ඉක්ම වූ රාජ්‍ය ආදායමට බැර නොකල තැන්පතු ගිණුම් **06** ක වටිනාකම රු.**344,140,699**ක් වූ අතර, වර්ෂ **5**ක් ඉක්ම වූ රු.**38,366,397**ක් ද එහි ඇතුලත් වී තිබුණි**.** | මෙම ශේෂයන් නිරවුල් කිරිමට පළාත් දෙපාර්තමේන්තු හා විද්‍යාපීඨ වෙත දැනුම් දී ඇති අතර මේ වන විට නිරවුල් වී ඇති ප්‍රමාණය මසක් ඇතුලත වාර්තා කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ යුතුව ඇත. |
| (ආ) දේශීය උපාධි අපේක්ෂක සිසුන් වෙනුවෙන් විදේශීය ශිෂ්‍යත්ව ලබා දීම සඳහා **2020** සහ **2021** වර්ෂවලදී චීන තානාපති කාර්යාලයෙන් ලබා දී තිබූ රු.**8,860,000** ක් ප්‍රතිලාභීන් වෙත ලබාදීමකින් තොරව වාර්තාවේ දිනය දක්වාම උසස් අධ්‍යාපන අංශයේ පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි**.** | 2021 වර්ෂයේ පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය මත ඉතිරි වී ඇති බව | ශිෂ්‍යත්ව ප්‍රදානය සඳහා විදේශයෙන් ලබාදෙන ප්‍රදාන ප්‍රමාදයකින් තොරව අදාළ ප්‍රතිලාභීන් වෙත ලබා දීමට කටයුතු කළ යුතුය. |

**2.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සැසඳුම් ප්‍රකාශ අනුව ස්ථානමාරු වී පැමිණි, ස්ථානමාරු වී ගිය, මියගිය, විශ්‍රාම ගිය, වැඩ තහනම් කල සේවය හැර ගිය, සේවයෙන් මුදා හල නිලධාරින්ගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු ශේෂය රු.198,883,895 ක් විය. ඉන් වර්ෂ 5 ඉක්ම වූ ශේෂය රු. 75,155,836 ක්වූ අතර, එම ශේෂ නිරවුල් කිරිමට හෝ අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබිණි. | තොරතුරු සොයාගත නොහැකි වීම්, ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම, මුදාහල නිලධාරින් නැවත සේවයට නොපැමිණිම වැනි හේතු නිසා ශේෂ නිරවුල් කිරිමට නොහැකි වී ඇති අතර ඉදිරියේදී නිරවුල් කිරිමට කටයුතු කරන බව. | හිඟහිටි ශේෂ අයකර ගැනීමටත්, ණය ශේෂ අයකරගෙන නිලධාරින් මුදා හැරීමටත් කටයුතු කිරීම. |

**2.5** **ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2.6** **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| විගණන නිරීක්ෂණ | | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවීම | | |
| (අ) | 1961 අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතෙහි 25 වන වගන්තිය | අවුරුදු 5 සිට 14 දක්වා වයස් සීමාවේ පසුවන දරුවන් සඳහා අධ්‍යාපනය ලබාදීමට පෞද්ගලික අංශයට පාසල් ආරම්භ කල නොහැකි වුවද, අධ්‍යාපන අමාත්‍යාංශයේ මැදිහත්වීමකින් තොරව ව්‍යාපාරික ආයතන ලෙස ජාත්‍යාන්තර පාසල්ද ආගමික පාසල් ලෙස මද්‍රසා පාසල් ද ආරම්භ කර තිබුණි. | 2007 අංක 07 දරන සමාගම් පනත හා 1978 අංක 4 දරන මහ කොළඹ ආර්ථික කොමිෂන් සභා පනත (BOI) යටතේ පිහිටුවා ඇති අතර මද්‍රසා පාසල් පිළිබඳ තොරතුරු ලබා ගැනීමේ සමීක්ෂණ කටයුතු සිදු කරමින් පවතී. 1961 අංක 8 දරන උපකෘත පාඨශාලා පනත යටතේ මෙම පාසල් ආරම්භ කර නැත. | 1961 අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත සක්‍රියව බලාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 1986 අංක 30 දරණ අධ්‍යාපනික විද්‍යායතන පනතේ 3,4 හා 5 වගන්ති | විද්‍යාපීඨ කලමනාකරණය සඳහා "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන අධ්‍යාපනික විද්‍යායතන සඳහා බලතල, කාර්ය හා කාර්තව්‍යයන් 18ක් නියම කර තිබුණි. එවැනි මණ්ඩලයක් 2008 වර්ෂයේ සිට වාර්තාවේ දින දක්වා ක්‍රියාත්මකව පැවති බවට සාක්ෂි නොවීය. | පිළිතුරු ලබාදී නොමැත | අධ්‍යාපනික විද්‍යායතන මණ්ඩලය පිහිටුවීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1999 අංක 44 දරන යුනෙස්කෝ ශිෂ්‍යත්ව අරමුදල් පනතෙහි (i) 3(2) ඡේදය | කළමනාකරණ මණ්ඩලය විසින් යුනෙස්කෝ ශිෂ්‍යත්ව අරමුදලේ පරිපාලනය සහ කළමනාකරනය කල යුතු වුව ද වසර 20 ට කළමනාකරණ මණ්ඩල රැස්වීම් 09 ක් පමණක් පවත්වා තිබුණි. | 2020 හා 2021 වර්ෂයේ රටේ පැවැති කොවිඩ් - 19 වසංගත තත්වය හමුවේ කමිටු රැස්වීම් සඳහා සාමාජිකයින් රැස්කර ගැනීමේ ගැටලු හේතුවෙන් නිසි පරිදි පැවැත්වීමට නොහැකි වු බව. | පනත ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| | (ii) 9 වන ඡේදය (1) (2) (3) වගන්ති | අරමුදලේ ගණුදෙනු සම්බන්ධව විධිමත් පරිදි ගිණුම් පිළියෙල කර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් පොත විධිමත්ව පවත්වා ගෙනගියද උපයෝගී පොත් හා ලෙජර ගිණුම් පවත්වාගෙන ගොස් නොමැති බැවින් ලෙජර ගිණුම් පිළියෙල කර ඒ අනුව අවසාන ගිණුම් පිළියෙල කර කඩිනමින් ඉදිරිපත් කිරීමට නියමිත බව | -එම- |
| (ඈ) | 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ 19 න් විද්‍යාපීඨ 08 ක ඉකුත් වර්ෂය සඳහා සහ සමාලෝචිත වර්ෂයේ කිසිදු විද්‍යාපීඨයක භාණ්ඩ සමීක්ෂණය සිදුකර නොතිබුණු අතර සිදුකල සමීක්ෂණ වලද වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2021 වර්ෂය පුරාවට ලංකාවේ සියළුම විද්‍යාපීඨවල කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථාන ස්ථාපිත කර තිබූ බැවින් නියමිත වේලාවට භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කිරීමට නොහැකි වූ බව. | සියලුම විද්‍යාපීඨ වල භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කිරීමටත් සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 2.7 වෙනත් නිරීක්ෂණ

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2008 සැප්තැම්බර් මස 24 දිනැති අංක අමප/08/1742/316/086 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාව පිහිටුවා තිබුණි. ඒ හා සම්බන්ධ හෝ ඊට අදාල කෙටුම්පත් පනත 2008 ඔක්තෝබර් නීති කෙටුම්පත් සම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටද පනතේ කටයුතු අවසන් කර නොතිබුණි. . | නීති කෙටුම්පත් සම්පාදන දෙපාර්තමේන්තුවේ උපදෙස් මත පැරණි කැබිනට් තීරණය ප්‍රමානවත් නොවන බැවින් ලබා ගත් කැබිනට් තීරණය අනුව සකස් කරන ලද අවසන් කෙටුම්පත යොමු කර ඇත. | පනත සම්මත කරගත යුතුවීම. |
| (ආ) | කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය පත්කිරීම හා ගෙවීම් කිරීම පනතට අනුව සිදුකළ යුතු නමුත් පනත අනුමතව නොතිබියදී 2006 ඔක්තෝබර් 04 දිනැති අංක අමප/08/1742/316/087 දරන අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත කොමිෂන් සභාවට කාර්ය මණ්ඩලය පත්කර ගෙවීම් කර තිබුණි. තවද ප්‍රංශයේ පැරිස් නුවර පිහිටි යුනෙස්කෝ නිත්‍ය නියෝජිත කාර්යාලයට වෙත සම්බන්ධීකරණ නිලධාරිනියක් අනුයුක්ත කර පාරිශ්‍රමිකය වශයෙන් 2017 සිට 2021 වර්ෂය දක්වා එකතුව රු.35,648,813 ක ප්‍රතිපාදනයක් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත මුදා හැර තිබුණි. | **2021.12.31** වන දින සේවයෙන් පසු සම්බන්ධීකරණ නිලධාරිනියගේ සේවය අවසන් කිරීමට අධ්‍යාපන ලේකම් විසින් කටයුතු කර ඇති අතර ඒ බව පැරිසියේ සිටින තනාපතිතුමිය වෙත දන්වා ඇත. ඒ අනුව **2022** සිට අදාළ තනතුර අහෝසි කර ගෙවීම් නවතා ඇත | පනත සම්මතකර ගැනීමට කටයුතු කර පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | යුනෙස්කෝ ශිෂ්‍යත්ව අරමුදලට අයත් රු.මිලියන **10.26** ක් **2015** දී බැංකු ජංගම ගිණුමක තැන්පත් කර ශිෂ්‍යත්ව ලබා දීම **2017** වර්ෂයේ ආරම්භ කර තිබුණද ශිෂ්‍යත්ව ලබාදීම **2021** මැයි මස සිට නවතා දමා තිබුණි. | යුනෙස්කෝ ශිෂ්‍යත්ව අරමුදලට අදාළ මුදල් 1999 වර්ෂයේ සිට 2014.12.30 දින දක්වා යුනෙස්කෝ ශිෂ්‍යත්ව අරමුදලට අදාළ පොදු තැන්පත් ගිණුමේ තැන්පත්ව තිබුණි. ඉල්ලීම් ගණනාවකින් අනතුරුව අරමුදලේ කටයුතු පවත්වාගෙන යාම සඳහා එම මුදල් ජංගම ගිණුමේ තැන්පත් කර ඇත්තේ 2015 ජනවාරි | විධිමත් පරිදි නියමිත ශිෂ්‍යත්ව ලබා දීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| | මසදිය. එබැවින් එම අරමුදලට අදාළ කටයුතු ආරම්භ කර ඇත්තේ 2015 වසරේ සිට බව පෙන්වා දෙමි. | |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂය තුල අවසන් කිරීමට සැලසුම් කරන ලද කාර්යන් අතුරින් කිසිදු ප්‍රගතියක් ලඟාකර නොගත් අංශ 7කට අයත් කාර්යන් 56ක් පමණ වූ අතර, එහි ඇස්තමේන්තු වටිනාකම රු.428,610,000ක් විය. | කොවිඩ් 19 වසංගත තත්ත්වය පැවතීම, භාණ්ඩ වල මිල ගණන් වෙනස් වීම මත ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාද වීම, **Zoom** තාක්ෂණය ඔස්සේ කටයුතු කිරීමට තාක්ෂණික පහසුකම් නොමැති කම, අමාත්‍යංශය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ ප්‍රකාරව අලුත් වැඩියා කටයුතු නවතා දැමීම, විද්‍යාපීය කොවිඩ් මධ්‍යස්ථාන ලෙස පවත්වාගෙන යාම, ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම, මුදල් අමාත්‍යංශ චක්‍රලේඛය අනුව ගිවිසුම් අත්සන් නොකළ ප්‍රාග්ධන ව්‍යාපෘති අත්හිටුවීමට සිදු වීම වැනි හේතු මත ක්‍රියාකාරකම් ඉටු කිරීමට නොහැකි වී ඇත. | ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි ලෙස සැලසුම් සකස් කිරීමටත් සකස්කරන ලද සැලසුම්වලට අනුව කටයුතු කිරීමත් කළ යුතුය. |
| (ආ) | කොවිඩ් 19 වසංගත තත්ත්වය යටතේ 2021 වර්ෂය තුලදී දින 229 ක් පාසල් පැවැත්වීමට නියමිතව තිබුණද බස්නාහිර පළාත තුළ දින 102 ක් හා සෙසු පළාත් වල දින 143ක් පමණක් පාසල් පවත්වා තිබුණු අතර 2022.04.08 දින දක්වා පාසල් වර්ෂය දීර්ඝ කර තිබුණි . දරුවන්ගේ ඉගෙනීම් පාඩුවේ තරම තක්සේරු කර නොතිබූ අතර අහිමි වූ පාසල් දින වල විෂය කොටස් ආවරණය සඳහා දුරස්ථ ඉගැන්වීම් ක්‍රියාවලියට යොමු වුවද සංඥා ගැටලු හා අවශ්‍ය තාක්ෂණික පහසුකම් නොමැති වීම , සිසුන්ට මාර්ගගතව සම්බන්ධ වීමට නොහැකිවීම, | පිළිතුරු ලබා දී නැත. | ඉගෙනුම් අවස්ථා අහිමිවීම ආවරණය සඳහා වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතු වේ. |

දෙමාපියන්ගේ දුර්වල ආර්ථික තත්වය හේතුවෙන් මාර්ගගත අධ්‍යාපනයට සම්බන්ධ වීමට අපහසුතා ඇතිවීම ,ගුරුවරුන් බහුතරයකට දුරස්ථ අධ්‍යාපනය සම්බන්ධව අඩු දැනුමක් පැවතිම යන ගැටළු පැවතුණි. කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් 2020 හා 2021 වර්ෂවලදී සිසු ඉගෙනුම් අවස්ථා අහිමිවීම ආවරණය සඳහා 2021 සහ 2022 වර්ෂවලදී ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික අධ්‍යාපන ආයතනය විසින් දින 100 කඩිනම් වැඩසටහනක් පිළියෙල කර ක්‍රියාත්මක කිරීමට යෝජනා කර තිබුණ ද එම වැඩසටහන අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වී තිබුණි.

**3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| අමාත්‍යාංශයේ ශාඛා 15 කට අයත් කාර්යන් 30 ක ප්‍රගතිය සියයට 3.52 සිට සියයට 50 දක්වා පරාසයක පැවති අතර වතු පාසල් සංවර්ධන අංශයේ කාර්යසාධනය සියයට 3.52 ක ඉතා අවම මට්ටමක පැවතුණි. එහි ඇස්තමේන්තු වටිනාකම රු.17,937,640,000ක් විය. | ක්‍රියාකාරකම් ඉටු කිරීමට සැලසුම් කළ කාලය තුළ කොවිඩ් 19 වසංගත තත්ත්වය පැවතීම, භාණ්ඩ වල මිල ගණන් වෙනස් වීම මත ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාද වීම, ප්‍රමාණවත් අක්මුදල් නොලැබීම වැනි හේතු මත ක්‍රියාකාරකම් ඉටු කිරීමට නොහැකි වී ඇත. | ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි ලෙස සැලසුම් සකස් කිරීමටත් සකස්කරන ලද සැලසුම්වලට අනුව කටයුතු කිරීමත් කළ යුතු වේ. |

**3.3 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| 2020 දෙසැම්බර් අවසන් වූ “ළඟම පාසල හොඳම පාසල ” ජාතික වැඩ සටහනින් රු.7,270,000 ක් වැයකර තිබුණු පලාත් 03 ක විදුහල්පති නිල නිවාස 5ක් හා ගුරු නිවාස 9 ක් 2022 ජූලි 05 වන විටත් වැඩ අවසන් කර නොතිබුණි. තවද භෞතික ප්‍රගතියක් නොමැති නමුත්, රු. 6,519,755 ක් වැය කර තිබුණු විදුහල්පති නිල නිවසක් හා ගුරු නිවසක් ද | පිළිතුරු ලබා දී නොමැත. | අත්හැර දැමූ ව්‍යාපෘති අවසන් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

පැවතුණි. මෙම ව්‍යාපෘතියට අදාලව පලාත් 07 ක් ඉදිරිපත්කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය අවසන් වන විට වැඩ ආරම්භ කර තිබුණු නමුත් අවසන් කිරීමට පෙර ඇස්තමේන්තු වටිනාකම රු.2,330,567,473 ක්වූ ව්‍යාපෘති 117 ක් අත්හැර තිබුණු අතර එම ව්‍යාපෘති වෙනුවෙන් 2022 මාර්තු 31 දිනට රු.මිලියන 1,850,981,812 ගෙවා තවදුරටත් රු.1,755,968,623 ක් ගෙවීමට තිබුණි.

## 3.4 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 අප්‍රේල් 05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මොරටුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයක් ස්ථාපිත කිරීමට තීරණය කර තිබුණි.එසේ වුවද ඉදිකිරීම් කරන පෞද්ගලික ඉඩම අත්පත් කර නොගැනීමට නොහැකිවීම හේතුවෙන් වෛද්‍ය පීඨයට අවශ්‍ය ගොඩනැගිලි සංකීර්ණ සැලසුම් කිරීම/ ඉදිකිරීම කටයුතු සඳහා කුවේට් අරමුදල සමඟ ගිවිසුම්ගත වීමට නොහැකි වී තිබුණි. සමාලෝචිත වර්ෂයේද රු.මිලියන 200 ක දේශීය ප්‍රතිපාදන සලසා තිබුණද උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණි. | මොරටුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ඉදිකිරීම සඳහා ලබාදී ඇති රු. මිලියන 200 ක මුදල් ප්‍රතිපාදන, කුවේට් රජයේ අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වූ කුවේට් අරමුදල සමඟ 2021 වර්ෂය තුල ගිවිසුම් ගත නොවීම නිසා උපයෝජනය කර නොමැත.කෙසේ වූවද, මොරටුව විශ්වවිද්‍යාලයීය වෛද්‍ය පීඨය ආරම්භ කර සිසුන් 104 දෙනෙකු 2019/2020 අධ්‍යයන වර්ෂය සඳහා බඳවාගෙන ඇති අතර දේශීය අරමුදල් ප්‍රතිපාදන යටතේ ප්‍රථම වසර අධ්‍යයන කටයුතු ආරම්භ කර ඇත. | අමාත්‍ය මණ්ඩල තීරණය හා සැලසුම් ප්‍රකාරව වෛද්‍ය පීඨය පිහිටුවීමේ අරමුණු සපුරා ගැනීම සඳහා ප්‍රමාදයකින් තොරව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | වයඹ විශ්වවිද්‍යාලය වටා ඇති විශාල ජල පෝෂක ප්‍රදේශ සංවර්ධනය කිරීම සහ විශ්වවිද්‍යාල ලෝක ශ්‍රේණිගත කිරීම් තුළ වයඹ විශ්වවිද්‍යාලය ඉහළ මට්ටමකට පත් කිරීම ප්‍රධාන අරමුණු ඇතිව 2017 ඔක්තෝබර් 24 දින ආරම්භ කර 2020 දෙසැම්බර් වනවිට නිම කිරීම සඳහා රු.මිලියන 4,077 ක ව්‍යාපෘති අගයකට සෞදි රජය සමඟ අත්සන් කරන ලද ගිවිසුමක් මත ක්‍රියාත්මක විය. ව්‍යාපෘති කාලය වරින් වර දීර්ඝ කර අවසන් වරට 2023 ජනවාරි 31 දින දක්වා දින දීර්ඝ | මෙම ව්‍යාපෘතියේ ගෙවීම් සෘජු ගෙවීම් පදනම මත සිදු කරන ගෙවීම් වන බැවින් සෞදි අරමුදල වෙත රු. මිලියන 509 ක වටිනා ගෙවීම් වවුචර් අදාල භාණ්ඩ සැපයීමෙන් අනතුරුව ඉදිරිපත් කර තිබුණි. සෞදි අරමුදල මඟින් කොන්ත්‍රාක්කරුවන් /සැපයුම්කරුවන්ගේ බැංකු ගිණුම් වෙත අදාල මුදල් විධිමත් පරිදි සෘජුවම වර්ෂය තුල ප්‍රේෂණය කර තිබුනද එම ගෙවීමට අදාල හර | එළඹෙන ලද ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර අනුමත ඇස්තමේන්තු පිරිවැය සීමාව තුළ ව්‍යාපෘතිය නිම කිරීමට ක්‍රියා කළ යුතු අතර දැනට සිදුව තිබෙන ප්‍රමාදය අනුව ඉලක්කගතව ඇති දිනට ව්‍යාපෘතිය අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කර තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට ළඟාකර ගෙන තිබූ භෞතික ප්‍රගතිය සියයට 29 පමණක් විය. | පත් (**Debit Advice)** 2021.12.31 දින වන විටත් (එම අරමුදල මගින්) මහාභාණ්ඩාගාරය වෙත එවා නොතිබූ බැවින් 2021 වර්ෂයට අදාලව ගිණුම් ගතවීමේ ප්‍රමාදයක් සිදු වී ඇත. රු.මිලියන 509 ට අමතරව ප්‍රතිපාදන උපයෝජනය නොවූ බැව් නිරූපණය වීමට හේතුව, ව්‍යාපෘතිය මගින් ඉදිරිපත් කරන ලද වවුචර් සඳහා ප්‍රදානකරු විසින් ගෙවීම් කර තිබුණද එම වියදම් ගිණුම්ගත කිරීම සඳහා වර්ෂය තුල දී වාර්තා නොවීම වේ. වර්තමාන භෞතික ප්‍රගතිය සියයට 29 වන බව වාර්තා කරමි. | |
| (ඇ) | කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය වෙනුවෙන් ඉදිකරනු ලබන මහල් 17 කින් යුත් ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2017 වර්ෂයේදී රු.මිලියන 4707.5 ක් වටිනා කොන්ත්‍රාත්තුවක් පෞද්ගලික සමාගමට පිරිනමා මෙම කොන්ත්‍රාත්තුව 2020 දෙසැම්බර් වනවිට අවසන් කිරීමට සැළසුම් කර තිබුණි. 2022 ජනවාරි 15 දක්වා තවදුරටත් දින දීර්ඝ කර තිබුණ ද වාර්තාවේ දිනය දක්වාම ව්‍යාපෘතිය නිමකර නොතිබුණි. | 2020 දෙසැම්බර් මස වන විට මෙම ව්‍යාපෘතිය නිමකිරීමට සැලසුම් කර තිබුණද එය 2022 වර්ෂය දක්වා දින දීර්ඝ කිරීමට සිදුවී ඇති බවට වන විගණන නිරීක්ෂණය පිළිගනිමි.<br>ව්‍යාපෘතියේ කටයුතුවල කරුණු කිහිපයක් හේතුවෙන් ප්‍රමාද වූ අතර 2022.03.31 වන විට ව්‍යාපෘතියෙන් 99.5 ක් ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත. ගොඩනැගිල්ලෙන් මහල් 06 ක් විශ්වවිද්‍යාලයට භාරදී ඇති අතර, මහල් 09 ක් කොන්ත්‍රාත්කරු විසින් උපදේශන ආයතයට භාර දී ඇත. පහලම මහල් දෙකෙහි නිමා කිරීමේ කටයුතු සිදුකරමින් පවතී. | මහල් සියල්ලේම ඉතිරි වැඩ කඩිනමින් අවසන් කොට අදාළ අරමුණු වෙනුවෙන් යෙදවිය යුතුය. |
| (ඈ) | රුහුණු විශ්වවිද්‍යාලයේ ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 1,180 ක් වන මහල් 12 කින් යුත් වෛද්‍ය පීඨ ගොඩනැගිල්ල ඉදිකිරීම් ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරුගේ ප්‍රමාදය නිසා 2019 දෙසැම්බර් 23 දින කොන්ත්‍රාත් ගිවිසුම අවලංගු කර තිබුණි. කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබූ රු.මිලියන 155.3 ක් වූ අත්තිකාරම අයකර ගැනීමට ගෙන තිබුණු අධිකරණ ක්‍රියාමාර්ග | රුහුණු විශ්වවිද්‍යාලය නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි 2020.06.10 වැනි දින ගරු වාණිජ මහාධිකරණය ඉදිරියේ විරෝධතා ගොනු කර ඇති අතර එකී පෙත්සම සඳහා වග උත්තරකාර රුහුණු විශ්වවිද්‍යාලය උත්තර බැඳ ඇත. ඒ සම්බන්ධව දැනටමත් වග උත්තරකරුවෙකු වන ලංකා බැංකුව මේ | ඉදිරි කොන්ත්‍රාත් ප්‍රදානවලදී අදාළ කොන්ත්‍රාත්කරු අසාර්ථක කොන්ත්‍රාත්කරුවකු ලෙස සළකා ලංසු ප්‍රදානය නොකිරීමටත් අත්තිකාරම් මුදල අයකර ගැනීමටත් කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සමාලෝචිත වර්ෂය අවසාන වන විටද අවසන් වී නොතිබුණි. | සම්බන්ධයෙන් උත්තරයක් බැඳ නැති අතර 2021.11.12 දින වාණිජ මහා අධිකරණයේ මෙම නඩුව කැඳවූ අවස්ථාවේදී ලිඛිත දේශන ගොනු කිරීමට 2022.01.28 දින ලබා දී ඇති බව වාර්තා කර ඇත. ඒ අනුව අදාළ සුරක්ෂණ මුදල් ලබා ගැනීමට විශ්වවිද්‍යාලය කටයුතු කරමින් සිටී. | |
| (ඉ) | මාස 36 කින් වැඩ අවසන් කිරීමේ පදනමින් රු මිලියන 1,138.4 ක් වටිනා කරාපිටිය රෝහලේ මහාචාර්ය ඒකකයක් පිහිටුවීමේ ව්‍යාපෘතිය **2017** මාර්තු ආරම්භ කර තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසන් වනවිට ව්‍යාපෘතියේ ව්‍යුහාත්මක ඉදිකිරීම් පමණක් නිමකර තිබුණි. | මේ වන විට අදාල ව්‍යාපෘතියේ මහල් 07 ක ව්‍යුහාත්මක ඉදිකිරීම් නිමකර ඇති අතර ව්‍යාපෘතිය නිම කිරීමේ කාල ප්‍රමාදය සිදුව තිබෙන බැව් පිළිගනිමි.<br>සෞඛ්‍ය අමාත්‍යාංශය සමඟ අවබෝධතා ගිවිසුම අත්සන් කිරීමේ ප්‍රමාදයන්, ඉදිකිරීම සිදුකරන භූමියේ පැවති වෛද්‍ය නිල නිවාස ඉවත් කිරීමේ ප්‍රමාදයන්, අරමුදල් නිදහස් වීමේ ප්‍රමාදයක් සිදුවීම සහ කොවිඩ් 19 වසංගතය හේතුවෙන් ප්‍රමාද විය. | නියමිත කාල පරිච්ඡේදය තුළ ව්‍යාපෘති කටයුතු නිම කර අපේක්ෂා කරගත් අරමුණු වෙනුවෙන් උපයෝජනය කළ යුතුව ඇත. |

**3.5 විදේශ ණය සහ ආධාර ව්‍යාපෘති**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ද්වීතියික අධ්‍යාපනය සඳහා තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන ස්ථාපනය | | |
| **(i)** මේ සඳහා හෝමාගම උතුරු පිටිපන ජාතික මට්ටමේ විෂයානුබද්ධ අන්තර්ගත/ මෘදුකාංග හා පරිගනක යෙදවුම් නිර්මාණය කිරීමේ මධ්‍යස්ථානයක් ඉදිකිරීම ව්‍යාපෘති ශක්‍යතා වාර්තාව අනුව යෝජිතව තිබුණද පසුව 2018 ජුනි මස 13 දිනැති අංක අමප/18/1142/835/005 දරන අමාත්‍ය මණ්ඩල තිරණයට අනුව කුලියාපිටිය නාරංගලවත්ත භූමිය ඒ සඳහා නිර්දේශ කර තිබුණි. නැවත 2020 ජනවාරි මස 09 දින අංක | පිළිතුරු ලබා දී නොමැත | ව්‍යාපෘති සම්බන්ධ නිශ්චිත ප්‍රතිපත්තිමය තීරණ ගෙන ව්‍යාපෘතියේ ප්‍රතිලාභ ලබාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අමප/19/3468/219/016 දරණ අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව හෝමාගම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව දැනට භාවිතාකරන අක්කර 08 ක් වන ඉඩමෙන් භාවිතයට නොගන්නා කොටස යොදා ගැනීමට තීරණය කර තිබුණි. මෙලෙස ව්‍යාපෘතියේ ඉදිකිරීම් වලට අදාල යෝජිත ඉඩම් වරින්වර වෙනස් කිරීම නිසා ව්‍යාපෘතියට අදාළ ණය ගිවිසුම 2019 වර්ෂයේ අත්සන් කළද ව්‍යාපෘතිය සක්‍රියව ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණු අතර ව්‍යාපෘති කාල සීමාව ද ඉක්මවා තිබුණි. | | |
| **(ii)** | එසේම දකුණු පළාත සඳහා නිල්වලා විද්‍යාපීඨ භූමියෙහි ද නැගෙනහිර පළාත සඳහා අඩ්ඩාලච්චේනෙයි විද්‍යාපීඨ භූමියෙහිද පළාත් තොරතුරු තාක්ෂණ අධ්‍යාපන මධ්‍යස්ථාන **2** ක් ඉදිකිරිම සඳහා අනුමැතිය ලැබුණි. පසුව **2021.07.26** දිනැති අංක අමප/**21/1324/308/113** දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව දකුණු පළාත් තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය දකුණු පළාත් සභාවට අයත් පාසල් භූමියක ඉදිකිරිමටත්, **2021.09.28** දිනැති අංක අමප/**21/1655/308/113-1** දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව නැගෙනහිර පළාත් තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය සඳහා ත්‍රිකුණාමල වරාය පාරේ මුලික පිඹුරු අංක **528** හි කැබලි අංක **1** ඉඩම යොදා ගැනීමටත් තීරණය කර තිබුණි. **2019** වර්ෂයේ ණය ගිවිසුම අත්සන් කළද වරින්වර ම්‍යස්ථාන ඉදිකීරීමේ ස්ථාන වෙනස් කිරීම හේතුවෙන් ව්‍යාපෘතිය සක්‍රිය කිරිමට නොහැකි වී තිබුණි. අංක **SRI/31-2573** දරන **2021** නොවැම්බර් **09** දිනැති කොරියානු **EXIM** බැංකුවේ ලිපියෙන් මෙම ව්‍යාපෘතියේ මධ්‍යස්ථාන ඉදිකිරීමට යෝජිත ස්ථානය නැවත වෙනස් නොකරන බවට සහතිකයක් ඉල්ලුම්කර තිබුණි. එම සහතිකය ඉදිරිපත්කර නොතිබුණු අතර **2019 – 2021** ව්‍යාපෘති කාල සීමාව තුළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිමටද නොහැකි වී තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | ව්‍යාපෘති සම්බන්ධ නිශ්චිත ප්‍රතිපත්තිමය තීරණ ගෙන ව්‍යාපෘතියේ ප්‍රතිලාභ ලබාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ඉන්දියානු රජයේ ආධාර යටතේ වතු පාසල් වල යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2021 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව රු:මිලියන 129 ක ප්‍රාග්ධන ප්‍රතිපාදනයක් සලසා තිබුණද 2021.12.31 දින වන විට එයින් කිසිදු ප්‍රගතියක් වාර්තා කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | සැලසුම අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | පොලොන්නරුව දිස්ත්‍රික්කයේ බහුවාර්ගික හා ත්‍රෛභාෂා අධ්‍යාපනය සහිත නව ජාතික පාසලක් ඉදි කිරිම සඳහා 2017.10.25 දින රු.297,843,626 ක් වටිනා කොන්ත්‍රාත්තුවකට පෞද්ගලික සමාගමක් සමඟ ගිවිසුමකට එළඹ තිබුණු අතර 2018 වර්ෂයේදී රු.59,568,725 ක ප්‍රාරම්භක අත්තිකාරම් සහ එයට අදාලව රු. 8,935,309 ක වැට් බදු එම වර්ෂයේදී අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂයට හර කර තිබුණි. ඉදිකිරීම් කටයුතු වල ප්‍රමාදය හේතුවෙන් 2020.01.22 දින එම ගිවිසුම අවසන් කර තිබුණු අතර එදිනට අය වීමට තිබූ ප්‍රාරම්භක අත්තිකාරම් මුදල රු.40,850,633 ක් සහ වැට් බදු රු.6,127,600 ක් විය. එසේම ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය ප්‍රමාදයට අදාලව ඉල්ලුම්කල උපදේශන ගාස්තුව රු. 5,027,451 කි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට මෙහි ප්‍රගතිය සියයට 42.3 ක් වූ අතර ව්‍යාපෘතිය අවසන් වන තෙක්ම ප්‍රමාද කාලයට උපදේශන ගාස්තු ගෙවීමට අමාත්‍යාංශයට සිදුවනු ඇත. | පිළිතුරු ලබා දී නොමැත. | ව්‍යාපෘති කටයුතු ප්‍රමාදයකින් තොරව ගිවිසුම් ප්‍රකාරව අවසන් කළ යුතුය |
| (ඈ) | අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) හා අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) පන්තිවල තාක්‍ෂණ විෂය උගන්වන ගුරුවරුන්ගේ ඌණතාවය අවම කිරීම, තාක්‍ෂණ විෂය හදාරන සිසුන්ට ගුරු තාක්‍ෂණලාභීන් ලෙස උසස් අධ්‍යාපනය ලැබීමට අවස්ථාව සැලසීම, තාක්‍ෂණ විෂය උගන්වන ගුරුවරුන්ට තම වෘත්තිය සංවර්ධනය සඳහා තාක්‍ෂණ විෂයට අදාළව ගුරු පුහුණුව ලබාදීම ආදී කරුණු පදනම් කරගනිමින් තාක්ෂණ විෂය සඳහා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයක් ඉදිකිරීම සඳහා 2017 ජනවාරි 18 දිනැති අංක අමප/16/2647/742/036-1 දරණ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සඳහා අනුමැතිය ලබාදී තිබුණි. 2017 අප්‍රේල් 19 දිනැති අතිවිශේෂ | පිළිතුරු ලබා දී නොමැත. | ඉදිකිරිම් කටයුතු ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. |

ගැසට් පත්‍රයේ පල කරනු ලැබූ 2017 අංක 93 දරණ ආඥාව මගින් අදාළ ඉදිකිරීම සඳහා කුලියාපිටිය බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් නාරංගොල්ල ප්‍රදේශයේ ඉඩමක භුක්තිය අධ්‍යාපන ලේකම් වෙත පවරා තිබුණි. කොරියානු රජයේ ආධාර මත ඉදිකිරීමට සැලසුම් කරන ලද මෙම ව්‍යාපෘතියට 2019 සහ 2020 වර්ෂයන් තුල මුල්ගල් තැබීම ඇතුළු වියදම් සඳහා ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතිය මගින් රු.මිලියන 15.3 ක මුදලක් වැයකර තිබුණද, ව්‍යාපෘතියේ වැඩ කටයුතු මේ වන විට නවතා දමා තිබුණි. ව්‍යාපෘතිය කාර්යයන් ප්‍රමාද වීම හේතුවෙන් අන්තර්ජාතික කොරියානු සහයෝගිතා ඒජන්සිය (KOICA) ව්‍යාපෘතියෙහි ඉදිකිරීම්වලින් ඉවත් වී එහි වගකීම අමාත්‍යාංශයට පවරා දී තිබුණද විගණිත දිනය වූ 2022 මැයි 31 වන තෙක් මෙහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට අමාත්‍යාංශය අපොහොසත්වී තිබුණි..

## 3.6 වත්කම් කළමනාකරණය

----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නියැදි පරීක්ෂාවට අනුව දිවයිනේ පාසල් 26 කට අයත් අක්කර 49 රූඩ් 02 පර්.33ක්ද, ගුරු විද්‍යාල 03කට අයත් අක්කර 07 රූඩ් 01 පර්චස් 25 ක් හා විද්‍යාපීඨයක් සතුව පැවති අක්කර 91 පර්චස් 24 ක්ද අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව බාහිර පාර්ශවයන් විසින් අනවසරයෙන් භුක්ති විඳිමින් පැවතුණද ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි. | අනවසර පදිංචිකරුවන් ඉවත්කිරීම සම්බන්ධව 1979 අංක 07 දරණ රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබාගැනීමේ) පනතේ 18 වගන්තිය අනුව ඕනෑම රජයේ ඉඩමක් සම්බන්ධයෙන් නිසි බලධාරියා දිස්ත්‍රික්කයක ආණ්ඩුවේ ඒජන්ත, අතිරේක ඒජන්ත හෝ සහකාර ඒජන්තය. අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවතින සියලුම පාසල් වල ගැටලු සම්බන්ධව වෙන් වෙන් වශයෙන් මැදිහත් වීමට ප්‍රායෝගිකව ඇති අපහසුතා නිසා විදුහල්පතිවරුන් සහ පීඨාධිපතිවරුන් ගැටලු ඉදිරිපත් කරන අවස්ථා වලදී අදාළ ප්‍රාදේශීය ලේකම් හා සම්බන්ධ වී ගැටලුව විසඳා ගැනීමට කටයුතු කරන ලෙස විදුහල්පතිවරුන් හා පීඨාධිපතිවරුන් දැනුවත් කරනු ලබයි.අවශ්‍ය අවස්ථා | වත්කම් කළමණාකරනය මනාව සිදුකර ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | වලදී ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු මඟින් ගැටලු නිරාකරණය කරනු ලබයි. | |
| (ආ) | ජාතික පාසල් 13ක භාවිතයට ගත හැකි තත්වයේ පවතින නිල නිවාස 13ක් භාවිතයෙන් තොරවද, ජාතික පාසල් 21ක නිල නිවාස අලුත්වැඩියා නොකිරීම හේතුවෙන් භාවිතයට ගත නොහැකිවද, ජාතික පාසල් 06ක නිල නිවාස අලුත්වැඩියා කර හෝ භාවිතයට ගත නොහැකි ලෙස අබලන් තත්වයෙන්ද පැවතුණි. එසේම එවැනි නිවාස, නිල නිවාස ලෙස භාවිතා නොකර පාසලේ විවිධ වූ කාර්යයන් සඳහා යොදාගන්නා අවස්ථා 10ක් පැවතුණි. | පිළිතුර ඉදිරිපත් කර නැත. | නිල නිවාස කළමණාකරනය මනාව සිදු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | විගණනය වෙත ඉදිරිපත් කර තිබූ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ 10ක තොරතුරු අනුව විද්‍යාපීඨ වලට අයත් නිල නිවාස 17ක වෙනත් රාජ්‍ය ආයතන වල සේවය කරනු ලබන නිලධාරින් පදිංචි වී සිටින අතර, විද්‍යාපීඨ 2කට අයත් ඉඩම් අනවසරෙන් අත්පත් කරගෙන තිබුණි. | පිළිතුර ඉදිරිපත් කර නැත. | අනවසර පදිංචි කරුවන් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |

**3.7 පාඩු හා හානි**

--------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2013/2014 වර්ෂයන්හි අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කටයුතු හා පත්තල ගෙදර විද්‍යා උපකරණ ගබඩාවේ අක්‍රමිකතා සම්බන්ධයෙන් විශේෂ විමර්ශනයක් සිදුකර එමගින් හදුනාගත් අක්‍රමිකතා සම්බන්ධයෙන් මු:රෙ 104 පරීක්ෂණයක් පවත්වන ලෙස 2021 අමාත්‍යාංශ ලේකම් දන්වා තිබූ නමුත් විගණිත දිනය වනවිට මු:රෙ 104 පරීක්ෂණ මණ්ඩලය පත්කිරීම හැර කිසිදු වාර්තාවක් නිකුත්කර නොතිබුණි. | මු.රෙ.104(4) පරීක්ෂණයක් සිදු කිරීම සඳහා අමාත්‍යාංශ නිලධාරීන්ගෙන් යුත් පරීක්ෂණ මණ්ඩලයන් පත් කර ඇති අතර, පරීක්ෂණ පවත්වා කඩිනමින් පරීක්ෂණ වාර්තාව ලබා දෙන ලෙස පරීක්ෂණ මණ්ඩල සභාපතිවරයා දැනුවත් කර ඇත. | මුදල් රෙගුලාසි හා අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.8 කළමනාකරණ දුර්වලතා**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නාගරික සංවර්ධන අධිකාරියට අයත් හෙක්ටයාර 1.9320 ක භූමි ප්‍රමාණයක රු. මිලියන 1098.24 ක් වැය කර අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ආරක්ෂක සේවා විද්‍යාලය ඉදි කර තිබුණද, ඉඩමේ නෛතික අයිතිය අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට හා වටිනාකම ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ආරක්ෂක සේවා විද්‍යාලය පිහිටි ඉඩම අධ්‍යාපන අමාත්‍යාංශය වෙත පවරා දීම සඳහා එම ඉඩම වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරිය විසින් දරණ ලද පිරිවැය වටිනාකම එම අධිකාරිය වෙත ගෙවන ලෙස දන්වා ඇත. ඒ අනුව, අදාළ පිරිවැය වටිනාකම පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු එම අධිකාරිය වෙතින් ඉල්ලා ඇති අතර මූල්‍ය අංශය විසින් එම තොරතුරු ලද වහාම අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව නාගරික සංවර්ධන අධිකාරිය විසින් දන්වා ඇත. | නෛතික අයිතිය අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට හා ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | අමාත්‍යවරයාගේ මාධ්‍ය අධ්‍යක්ෂක වෙත පූර්ව ප්‍රචාරක කාර්යන් සඳහා සාම්පල පරීක්ෂා කිරීමට ලබාදුන් ටැබ් පරිගණක 20 න් රු.364,000ක් වටිනා පරිගණක 07ක් අමාත්‍යාංශයට ආපසු ලබා ගැනීමට අපොහොසත් වී තිබුණි. | පරිගනක 07 ක් සඳහා මාධ්‍ය අමාත්‍යවරයා අබාන්ස් ආයතනය සමග ඇතිකරගත් එකඟතාවය මත අබාන්ස් ආයතනය විසින් ටැබ් පරිගනක 07 හෝ අදාල මුදල අමාත්‍යාංශය වෙත ගෙවීමට එකඟ වී ඇති බව. | වත්කම් අමාත්‍යාංශය වෙත ලබා ගැනීමට කඩිනමින් ක්‍රියා කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකාවේ සමස්ථ ගුරු කාර්ය මණ්ඩලයම උපාධිධාරීන් බවට පත්කිරීම සඳහා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ විශ්ව විද්‍යාල පීඨ තත්වයට උසස් කිරිමට ප්‍රතිපත්තිමය අනුමැතිය 2019 දෙසැම්බර් 31 දිනැති අමප/19/3353/219/006 අංක දරණ අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ලබා දී තිබුණි. එසේ වුවද මේ සඳහා විශේෂඥ කමිටුවක් පත්කර අදාල යෝජනාව ක්‍රියාත්මක කිරිමට අවශ්‍ය වැඩසටහන් සකස් කිරිමේ අදියරෙහි වාර්තාවේ දින වන විටත් පැවතුණි. | පිළිතුරු ලබා දී නැත. | අමාත්‍ය මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීම කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ගුරු ශික්ෂණලාභීන් පුහුණු කිරීම සඳහා අධ්‍යාපන විද්‍යා පීඨ 19 ක් පිහිටුවා වාර්ෂිකව රු.මිලියන 2,200 කට අධික මුදලක් ඒකාබද්ධ අරමුදලින් වැයකර තිබුණි. අධ්‍යාපන විද්‍යාපීඨ සඳහා වාර්ෂිකව සිසුන් ඇතුළත්කර ගැනීමේදී අ.පො.ස. උසස් පෙළ විභාගය පවත්වා වසර 3 ක් ගතවී තිබුණු 2018 පැවැත්වූ විභාගවලින් ශික්ෂණලාභීන් ඇතුලත්කර ගැනීම 2021 වර්ෂය වන විටද අවසන් වී නොතිබුණු අතර 2019 සහ 2020 වර්ෂවල විභාගවලින් ශික්ෂණලාභීන් බඳවා ගැනීම 2022 මැයි 22 වන විටත් ආරම්භකර නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත. | ශික්ෂණලාභීන් බඳවා ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එක්සත් ජාතින්ගේ තිරසර සංවර්ධන න්‍යාය පත්‍රයේ (2015-2030) අරමුණු 04 හි ඉලක්ක 1 අනුව ඵලදායී ඉගෙනුම් ප්‍රතිඵල ලබා ගැනීමට හැකිවන ආකාරයෙන් රජයේ නොවන පාසල්වල අධ්‍යාපනය ලබන දරුවන්ට ලබාදෙන අධ්‍යාපනය තුළ තිරසර සංවර්ධන අරමුණු 4 හි ඉලක්කය කරා ළඟාවීම සඳහා රජයේ නොවන පාසල් ලියාපදිංචියේදී, පවත්වා ගෙන යාමේදී හා අධීක්ෂණයේදී පාසලක තිබිය යුතු ගුණාත්මක හා ප්‍රමාණාත්මක පිරිවිතර සම්පූර්ණ වී නොතිබුණි. | ගුරුවරු, පාසල් සහ කලාප/ පළාත් නිලධාරීන්ගේ ආයතන කටයුතු පිළිබඳ දැනුවත්භාවය වර්ධනය කිරීමට කටයුතු කිරීම සඳහා චක්‍රලේඛ උපදෙස් මාලා සහ දැනුවත් කිරීමේ වැඩසටහන් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක, ස්වයං නියාමන ක්‍රියාවලියක් අත්හදා බැලීමට සැලසුම් කර ඇත. එමඟින් ක්‍රියාවලියේ පවතින ගැටළු හඳුනා ගැනීමට සහ සංවර්ධනය කිරීමට අපේක්ෂා කරන අතර 2022 වසරේ නියාමන වැමසටහනක් ලෙස ක්‍රියාත්මක කිරීම, ප්‍රමිති හා කළමණාකරන ශාඛාවේ විෂය පථයට රජයේ අනුමත පෞද්ගලික පාසල් ද ඇතුළත් කිරීමට කටයුතු කර ඇත. ජාත්‍යන්තර පාසල් ඇතුළු අනෙකුත් පෞද්ගලික පාසල් නියාමනය කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශයට නෛතික බලයක් ලබා ගැනීමට කටයුතු කිරීමට ද සැලසුම් කර ඇත. | එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන (2015-2030) න්‍යාය පත්‍රයේ අරමුණ 04 හි ඉලක්ක කරා ළඟා වීමට විධිමත් ක්‍රමවේද සකස් කර ඒවා කාලීනව ඇගයීම කල යුතුය. |

## 5. යහපාලනය

## 5.1 මහජනයා වෙත සේවා ඉටු කිරිම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන හා 2018 ජනවාරි 24 දිනැති අංක 05/2008 (i) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව පුරවැසි - සේවාලාභි ප්‍රඥප්තියක් ස්ථාපිත කර පවත්වාගෙන යාම සමාලෝචිත වර්ෂය අවසාන වන විටද සිදුකර නොතිබුණි | පිළිතුර ලබා දී නැත | චක්‍රලේඛ ප්‍රකාරව පුරවැසි-සේවාලාභි ප්‍රඥප්තියක් ස්ථාපිත කිරීම කල යුතුය. |

## 6. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ සහ ද්විතීයික මට්ටමේ නිලධාරීන් පුරප්පාඩු 2,234 ක් පැවතීම හේතුවෙන් කළමනාකරණ තීරණ ගැනීමේදීද අනෙකුත් පුරප්පාඩු හේතුවෙන් අමාත්‍යාංශ කටයුතු වලදීද අවහිරතා මතුවීමට ඉඩ පැවති බව නිරීක්‍ෂණය විය. | පිළිතුර ලබා දී නැත | අත්‍යාවශ්‍ය තනතුරු සඳහා වන පුරප්පාඩු සම්පූර්ණ කරගත යුතුව ඇත |
| (ආ) | ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල මාධ්‍ය තුනෙන් ක්‍රියාත්මක වන විෂයන් 45 ක අනුමත කතිකාචාර්ය තනතුරු 1,166 කින් පුරප්පාඩු 498 ක් පැවතුණි. සිංහල මාධ්‍ය කතිකාචාර්ය පුරප්පාඩු සියයට 40 ක් , දෙමළ මාධ්‍ය පුරප්පාඩු සියයට 48 ක් හා ඉංග්‍රීසි මාධ්‍ය පුරප්පාඩු සියයට 42 ක්ද පැවතිම අධ්‍යාපන විද්‍යාපීඨ පද්ධතියෙහි කාර්යය සාධනය කෙරෙහි සෘජු බලපෑමක් ඇතිකරවන්නක් විය හැකි බව නිරීක්ෂණය විය. | පිළිතුර ලබා දී නැත | -එම-. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | විද්‍යාපීය කාර්ය මණ්ඩලය සඳහා ස්ථාන මාරු ක්‍රියාපටිපාටියක් නොමැති අතර විද්‍යාපීය **10** ක අධ්‍යයන කාර්ය මණ්ඩලයෙන් **119** දෙනෙකුද, අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ **140** දෙනෙකුද, වසර **8** කට වැඩි කාලයක් ස්ථාන මාරු නොලබා එකම සේවා ස්ථානයේ සේවය කර තිබුණි. | පිළිතුරු ලබා ද නැත. | විධිමත් ස්ථාන මාරු ක්‍රියාපටිපාටියක් ක්‍රියාත්මක කිරීමට කටයුතු සිදු කළ යුතුය. |